## 12. සසෙත් මුද්‍රණාලය

මෙම මුද්‍රණාලය සමිතිය විසින් ආරම්භ කල තවත් ව්‍යාපෘතියකි. ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය සතුව තිබූ කොළඹ ග්‍රෑන්ඩ්පාස් හි නැකොසිල් නමින් පැවති මුද්‍රණාලය අප සමිතිය විසින් මිලදී ගන්නා ලදී. සියළුම ආකාරයේ මුද්‍රණ කාර්යයන් සපුරාලිය හැකි ආකාරයට “සසෙත්” මුද්‍රණාලය නමින් එය ප්‍රතිසංවිධානය කොට පවත්වා ගෙන යනු ලැබේ.

දැනටද අප මුද්‍රණ අංශය ගනුදෙනුකාරභවතුන් කෙරෙහි බෙහෙවින්ම කාර්යක්ෂම වූත් , ගුණාත්මක වූත් සේවාවන් සපයනු පිණිස කැපවී ක්‍රියාත්මක වේ. එසේම නවීන පහසුකම් සහිතව මෙම මුද්‍රණාලය නවීකරණ කරමින් මුද්‍රණ වෙළෙඳපොල තුල කටයුතු කිරීමට ද වැඩිදුරටත් අපේක්ෂා කරමු.

මෙම මුද්‍රණාලය මඟින්,

1. අප ආයතයේ සියළු ලේඛණ
2. වාර්ෂික දින දර්ශන
3. සංවත්සර වාර්තා පොත්
4. උදාන පොත් මුද්‍රණය කරනු ලබයි.